# 11 ඒකකය - ධ්වනිය(1)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.**

## ක්‍රියාකාරකම 11.1




11.1 රූපය

අවශ්‍ය ද්‍රව්‍ය :- ස්පීකරයක්, පොලිස්ටයිරීන් කැබලි, සම්බන්ධක කම්බි, වියළි කෝෂ

ක්‍රමය :-

- ස්පීකරයක් ගෙන එයට රූපයේ දැක්වෙන පරිදි සම්බන්ධක කම්බි සවි කර ස්පීකරය මත පොලිස්ටයරීන් කැබලි කිහිපයක් තබන්න.
- සම්බන්ධක කම්බිවල එක් කෙළවරක් වියළි කෝෂයට සම්බන්ධ කරන්න.
- සම්බන්ධක කම්බිවල අනෙක් කෙළවර වියළි කෝෂයේ කිහිපවරක් ගැටීමට සලස්වන්න. (කම්බි කෙළවර දිගටම වියළි කෝෂයේ ගැටීමට සැලැස්වීම නුසුදුසු ය)
- මෙලෙස කිහිප වතාවක් කම්බි කෙළවර වියළි කෝෂයේ ගැටීමට සලස්වමින් සිදුවන දේ නිරීක්ෂණය කරන්න.

➢ ඔබේ නිරීක්ෂණ සටහන් කරන්න.

## ක්‍රියාකාරකම 11.2

අවශ්‍ය ද්‍රව්‍ය :-

සරසුලක්, ආධාරකයක්, නූල්, පොලිස්ටයිරීන් බෝලයක්

ක්‍රමය :-

- රූපයේ දැක්වෙන පරිදි පොලිස්ටයිරීන් බෝලයක් සිහින් නූලකින් එල්ලා ගන්න.
- සරසුලක් ගෙන එය හොඳින් නාද කර පොලිස්ටයිරීන් බෝලය සමීපයට ගෙන එන්න.




11.2 රූපය

- සිදුවන දේ නිරීක්ෂණය කරන්න. (මෙය කිහිප වතාවක් සිදුකර නිරීක්ෂණ ලබා ගන්න.)

➢ ඔබේ නිරීක්ෂණ සටහන් කරන්න.

## ක්‍රියාකාරකම 11.3

ක්‍රමය :- • පින්තූරයේ දැක්වෙන පරිදි උගුරෙහි මැද අතේ ඇඟිලි කිහිපයක් තබා ගන්න.

- පසුව තරමක් සෙමෙන් කතා කරන්න.
- ඇඟිලිවලට දැනෙන දේ සඳහන් කරන්න.
- ඉන් පසුව තරමක් ශබ්ද නඟා කතා කරමින් ඇඟිලිවලට දැනෙන දේ සඳහන් කරන්න.



11.3 රූපය

➢ ඔබේ නිරීක්ෂණ සටහන් කරන්න.

## ක්‍රියාකාරකම 11.4

අවශ්‍ය ද්‍රව්‍ය :-

ගිටාරය, බෙරය, බටනලාව, තබ්ලාව වැනි ඔබට සපයා ගත හැකි සංගීත භාණ්ඩ

ක්‍රමය :-

- ඔබට සපයා ඇති ධ්වනි ප්‍රභවවලින් ශබ්දය උපදවන්න.
- එම එක් එක් ධ්වනි ප්‍රභවයෙන් ශබ්දය නිකුත් වන්නේ ඒවායේ කුමන කොටසක් කම්පනය වීම නිසාදැයි නිරීක්ෂණය කරන්න.
- නිරීක්ෂණ වගුගත කරන්න.



11.4 රූපය

➢ ඔබේ නිරීක්ෂණ පහත වගුවේ සටහන් කරන්න.

| ධ්වනි ප්‍රභවය/උපකරණය | කම්පනය වන දෑ |
|---|---|
| ගිටාරය | |
| බෙරය | |
| බටනලාව | |
| තබ්ලාව | |

- **තත්/තන්තු කම්පනය වීමෙන්, පටල කම්පනය වීමෙන්** හා **වාතය කම්පනය වීමෙන්** යන ක්‍රමවලින් ශබ්දය නිපදවෙන සංගීත භාණ්ඩ 5 බැගින් ලියන්න.